කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී සිව්වන පරීක්ෂණය - ප්‍රථම සෙමෙස්තරය - 2018/2019

**SOC 4186 – සමකාලීන සමාජ න්‍යාය**

පැ. දෙකයි (02)

ප්‍රශ්න <u>තුනකට (03)</u> පමණක් පිළිතුරු සපයන්න.

---

1. 'පරිභෝජන සමාජය වර්තමාන සමාජ පර්යායේ ප්‍රධානතම ගාමක බලවේගය වශයෙන් කටයුතු කරයි.' ඉහත ප්‍රකාශය ෂෝන් බොද්‍රියා ගේ අදහස් ඇසුරින් විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

2. ජෛව බලය (Bio-power) යනු කුමක් දැයි කෙටියෙන් පැහැදිලි කොට ජෛව බලය යන්න සමාජය තුළ ස්ථාපිත කිරීම කෙරෙහි දායක වන කථිකාව මිෂෙල් ෆුකෝගේ බලය දැනුම යන සංකල්පය ඇසුරින් විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

3. 'විසංයෝජනය සැඟවුණු සහ විරහිත (නොමැති) යථාර්ථය අනාවරණය කිරීමට සමත් වෙයි.' ෂාක් ඩෙරීඩාගේ පශ්චාත් ව්‍යුහවාදීය පිළිබඳ අදහස් ඇසුරින් සමකාලීන ලාංකේය සමාජයෙන් උදාහරණ සපයමින් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

4. 'වර්තමාන අධ්‍යාපන පද්ධතිය ජනතාව අතර විවිධ සමාජ අසමානතාවන් නිර්මාණය කරන සංස්කෘතික ප්‍රාග්ධනයක් වෙයි. ඉහත ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේද? පිය(ර්) බෝඩියෝ ගේ න්‍යායන්වලට අවධානය යොමු කරමින් ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

5. 'ද්‍රාවශීලි නූතනත්වය' (Liquid Modernity) යන සංකල්පය මගින් සිග්මන් බවුමන් සමකාලීන සමාජය විවේචනාත්මකව විශ්ලේෂණය කරයි. උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

6. 'ප්‍රත්‍යාවර්ථක නූතනත්වය' (Reflexive Modernity) යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කොට උල්රිච් බෙක් ට අනුව වර්තමාන ගෝලීය සමාජ ජීවිතය එහි ජීවත්වන්නන්ට බලවත් අවධානමක් නිර්මාණය කරන්නේ කෙසේදැයි උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

*************